# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1801/42 – 2013 මාර්තු 15 වැනි සිකුරාදා – 2013.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: එල්ආර්අයි-සීඩීපී/එස්ඩී/ආර්/1/(ඒඩීඩී).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් රජය විසින් අත්පත් කරගෙන ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගන්නා ලද ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්මලාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 521003 (කලාප අංක 5 පත්‍ර අංක 2) හා 2012.12.31 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 673 සහ 674 වශයෙන් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0017ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කොටස්:

01. **කැබලි අංක 673**
ඉඩමේ නම: කජුගහවත්ත නොහොත් කොට්ටම්බගහවත්ත සහ දොඹගහඕවිට හෙවත් ගැරිට්ටේඕවිට; විස්තරය: මාර්ගය; මුල් හිමිකම් කියන අය: මහින්ද විජේරත්න, 38/1, ගාමිණී පටුමග, රත්මලාන; ප්‍රමාණය: හෙක්. 0.0013.

02. **කැබලි අංක 674**
ඉඩමේ නම: කජුගහවත්ත නොහොත් කොට්ටම්බගහවත්ත සහ දොඹගහඕවිට හෙවත් ගැරිට්ටේඕවිට; විස්තරය: ලූනාව ප්‍රධාන ඇළ; මුල් හිමිකම් කියන අය: මහින්ද විජේරත්න, 38/1, ගාමිණී පටුමග, රත්මලාන; ප්‍රමාණය: හෙක්. 0.0004.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 අප්‍රේල් මස 10 යන දින දී යථා කාලයේ දී දැනුම් දෙනු ලබන පරිදි එකී නියමිත වේලාවට ''ලක්දිය මැඳුර'' නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 අප්‍රේල් මස 03වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. වීරබාහු,
අත්කර ගැනීමේ නිලධාරී.

2013 මාර්තු මස 14 වැනි දින,
ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලය,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය,
''ලක්දිය මැඳුර'' නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

03 - 1174

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: කේඕටී/එල්එන්ඩී/ඒසීකිව්වීඅයි/01/16.
ඉඩම් අමා. යොමු අංකය: එල්ඩී/05/2010/ඩබ්එස්/31.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.



සැ.යු.– මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලුගලහේන ග්‍රාම නිලධාරී වසමේ මතුගොබේ යන ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 169හි අතිරේක අංක 125හි පත්‍ර 107හි කැබලි අංක 1440, 1441 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1836ක් වූ පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

**කැබලි අංක 1440**

ඉඩමේ නම: දෙමලියදොල ලන්ද; හිමිකම් කියන අය: මසේල රාජමනී, අංක 41, රජමහා විහාර පාර, පිටකෝට්ටේ; ප්‍රමාණය: හෙක්. 0.0263.

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අංක 87.

**කැබලි අංක 1441**

ඉඩමේ නම: දෙමලියදොල ලන්ද; හිමිකම් කියන අය: මසේල රාජමනී, අංක 41, රජමහා විහාර පාර, පිටකෝට්ටේ; ප්‍රමාණය: හෙක්. 0.1573.

උතුරට, නැගෙනහිරට: කැබලි අංක 87; දකුණට සහ බටහිරට: කැබලි අංක 87 සහ 1383.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජුනි මස 17 දින පෙ. ව. 10.00ට කොටපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 ජුනි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2013 මාර්තු මස 11 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

03 - 1176

---

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: පිටීබී/එල්එන්ඩී/ඒසීකිව්වීඅයි/07/4.

උක්ත ශීර්ෂය යටතේ අංක 1525/22 හා 2007.11.30 වැනි දින දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කැබලි අංක 1584හි සඳහන් වන හෙක්ටයාර් ප්‍රමාණය 0.0088 හෙක්ටයාර් 0.0008 ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජී. ආර්. ජයනාත්,
ප්‍රාදේශීය ලේකම්,
පිටබැද්දර.

2013 මාර්තු මස 06 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පිටබැද්දර.

03 – 1175

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.